# ප්‍රසම්පාදන දැන්වීමයි

## රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

### රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ පවිත්‍රතා සේවාවන් සඳහා ලංසු කැඳවීම

**එන් - 37**

කොළඹ 08, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, අංක 118 පිහිටි රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු පරිශ්‍රයේ යෝජිත ස්ථානයන් අදාළ පවිත්‍රතා සේවාවන් පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් අවශ්‍යතා සපුරාලන පිළිගත් ලංසුකරුවන්ට පමණක් එක් වර්ෂයක කාලයකට (2022 / 2023) ජාතික තරගකාරී ලංසු කැඳවීම යටතේ 2022-03-29 වන දින සිට ලංසු ලියවිලි නිකුත් කරනු ලැබේ.

මේ සඳහා ඔබ විසින් සපුරාලිය යුතු මූලික සුදුසුකම් පහත පරිදි වේ.

1. ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ඉහත සේවාව සඳහා ලියාපදිංචි වී තිබීම.
2. රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පිළිගත් ආයතනවලට පවිත්‍රතා සේවා සැපයීම පිළිබඳව අවම වශයෙන් පූර්වාසන්න වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතු අතර, දැනටමත් එවැනි ආයතනයන්ට සේවා සපයන ආයතනයක් විය යුතුය. (සැ.යු. ඉල්ලුම් පත්‍රය සමග ඉහත අංක 1.2. සුදුසුකම් දැක්වෙන අදාළ සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා එවිය යුතුයි.)

   | | |
   |---|---|
   | ප්‍රසම්පාදනයේ නම | - රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට පවිත්‍රතා සේවාව පවත්වාගෙන යාම. |
   | ලංසු කැඳවීමේ අවසාන දිනය | - 2022-04-12 |
   | කොන්ත්‍රාත් අංකය | - DGP/OS/04/Clean.S/2022-2023 |
   | ලංසු විවෘත කිරීම | - 2022-04-12 ප.ව. 2.00 |

3. ලංසුවලට අදාළ ලිපි ලේඛන සැපයුම්කරුවන්ගේ ලිපි ශීර්ෂයක ලිඛිතව ඉල්ලුම් කර, පහත ලිපිනයේ පිහිටි රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ වෙනත් සැපයීම් අංශයෙන් සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලබාගත හැක. ඒ සඳහා ආපසු නොගෙවන රු. 2,500.00 ක තැන්පත් මුදලක් රජයේ මුද්‍රණාලයාධිපති වෙත ශ්‍රී ලංකා වලංගු රුපියල්වලින් ගෙවා කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතු අතර, ලංසුව අවසන් කරන දිනට පෙර දින ප.ව. 2.00 ට පෙර අදාළ ලිපි ලේඛන ලබාගත යුතුය.
4. 2022-03-29 වැනි දින සිට 2022-04-11 දින දක්වා වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා දෙපාර්තමේන්තුවේ වෙනත් සැපයීම් අංශයේ අදාළ ප්‍රසම්පාදන ලියවිලි, ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂාකර බැලිය හැකිය.
5. නිසි පරිදි සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන අයදුම්පත් නියමිත දිනයේදී නියමිත වේලාව අවසන් වීමට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ දෙපාර්තමේන්තුවේ වෙනත් සැපයීම් අංශයේ තබා ඇති ප්‍රසම්පාදන පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය. ප්‍රසම්පාදන ලියකියවිලි බහාලන කවරයේ වම් කෙළවරේ ප්‍රසම්පාදනයේ නම සඳහන් කළ යුතුය. ඔබගේ මිල ගණන් ඉදිරිපත් කරන කවරයේ "රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ පවිත්‍රතා සේවාවන් සඳහා මිල ගණන් 2022 / 2023" යනුවෙන් සඳහන් කළ යුතුය.
6. 2022-04-12 දින ප.ව. 02.00 ට මිල ගණන් කැඳවීම අවසන් වන අතර, එම වේලාවටම විවෘත කරනු ලැබේ.
7. පූර්ව ප්‍රසම්පාදන රැස්වීම 2022-04-04 දින පෙ.ව. 10.00 ට දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේ දී පවත්වනු ලැබේ.
8. වැඩි විස්තර සතියේ වැඩ කර දිනයන්හි පෙ.ව. 8.30 සිට ප.ව. 3.30 දක්වා පහත ලිපිනය සඳහන් කාර්යාලයේ වෙනත් සැපයීම් අංශයෙන් ලබාගත හැක.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව.**

**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.**

**2022-03-29**

**දුරකථන** : 0112673311 / ෆැක්ස් : 0112698653
**වෙබ් අඩවිය** : www.documents.gov.lk
**විද්‍යුත් තැපෑල** : othersupplydgp@gmail.com